

# ගමරාලයි සුදු අලියයි

## අපූරු නාට්‍ය අත්දැකීමක්

දිව්‍ය ලෝකේ සිට මනු ලොවට වැටෙන අලි පැටියකු ගමරාලගේ හේනේ ඇති පැණි කොමඩු, කෙහෙල්කැන්, බඩ ඉරිඟු, උක් ගස් කා දමා, කෙළිදෙලෙන් මුළු වගාව ම විනාශ කරන හැටි, ගමරාල වංගෙඩි ගස් බඳින හැටි, උගුලක් අටවා දිව්‍යමය අලි පැටියා අල්ලා ගන්නා හැටිත්, පසුව අනුකම්පාවෙන් ඌව නිදහස් කර උගේ නැට්ටේ එල්ලී අහසේ පාවී යන හැටි, ඉන්පසු නැවත මනුස්ස ලෝකයට ඇවිත් මුළු මහත් ගමක් එක්ක ආයෙත් දිව්‍ය ලෝකයට යන්නට ගොස් වැඩ වරද්දා ගන්නා හැටි, අහසින් පොළවට බිම වැටෙන හැටි......

කොහොමද මේ සිදුවීම් නාට්‍යයකින් පෙන්වන්නේ?..... ඒක තමයි අපූර්වත්වය. ලොකු පුංචි ඔබ සැම නිසැකව ම පැමිණ විඳ ගත යුතු අපූරු නාට්‍ය අත්දැකීම.

ගමරාලත්, ඔහුගේ පවුලේ උදවියත්, ගම්වැසියෝත් සුදු අලියෙකුගේ වලිගයේ එල්ලී දිව්‍ය ලෝකයට යන්නට ගිය ගමන පිළිබඳ අපි බොහෝ දෙනෙක් අසා ඇත්තෙමු. එය අපේ රටේ ගැමි ජන කථාවකි. කෙතරම් රසයෙන් අසා ගෙන සිටියත් මුළු මහත් ගමක් සුදු අලියෙකුගේ නගුටේ එල්ලී දිව්‍ය ලෝකය බලා ගුවන් ගැබේ පියාසරා ගිය ගමන සත්‍ය සිදුවීමක් ලෙස කිසිවකු විශ්වාස නොකරන්නකි. අභව්‍යයක් ලෙස ගැනෙන එවැනි ජන කථා මෙන් ම ජාතක කථාවන් ද අපේ සංස්කෘතියේ සහ සාහිත්‍යයේ අපමණ ය. ඒ ඇයි? වෙනත් මානයකින් හැදෑරිය යුතු සහ දීර්ඝ ලෙස කතිකාවට ලක් විය යුතු තවත් කරුණකි.

ඒ කෙසේ වුව ද ජන-ජාතක කථා ඇසුරින් අපේ සාහිත්‍යකරුවන් නිර්මාණකරණයේ නියැලුනේ අද ඊයෙක සිට නොවේ. සරච්චන්ද්‍රයන් මනමේ නාටකෙයන් එළිපෙහෙළි කළ දේශීය නාට්‍ය සම්ප්‍රදායේ ගමන් මග ඔස්සේ බිහිවුණු නිර්මාණ අදත් වේදිකාව මත රඟ දැක්වෙයි.

කුසුම්සිරි සහ යසෝධරා යනු සරච්චන්ද්‍ර නාට්‍ය සම්ප්‍රදාය තුළ අතිශයෙන් ම අත්දැකීම් බහුල නිර්මාණකරුවන් දෙදෙනෙකි. ආභාශය, පරිචය සහ භාවිතාව අතින් ගැමි රංග කලාවත්, ළමා නාට්‍ය කලාවත් සජීවී ලෙස අනාගත පරපුරට දායාද කිරීමට නොමඳව කැප වී, දේශීය හා විදේශීය වශයෙන් ද කටයුතු කරන්නෝ ය.

කුසුම්සිරි සහ යසෝධරා ජීවත් වන්නේ අප අතර ය. මෙල්බර්න් නුවර ය. පසුගිය වසර කිහිපය තුළ ඔවුන් අප ප්‍රජාවට දායාද කළ අපූරු නිර්මාණ පෙළ අතරින් නව්‍යතම නාට්‍ය අත්දැකීම 'ගමරාලයි සුදු අලියයි' නාට්‍ය යයි.

'ගමරාලයි සුදු අලියයි', නාට්‍යයක් කරන්නට තිබෙන හුදු ආසාව නිසාවත්, ආර්ථික ලාභ ලැබීමේ පිපාසාව නිසාවත් බිහි වුණ නාට්‍යයක් නොවේ. එය කාලයක් තිස්සේ අපේ ම දුවා දරුවන් හා විවිධ කුසලතා පිරුණු අප ප්‍රජාවේ සාමාජිකයන් එකතු කර ගනිමින් පවත්වා ගෙන යනු ලබන නාට්‍ය වැඩමුළුවක ප්‍රතිඵලයකි. නාට්‍යයක් බිහි වීමේ උචිත ක්‍රමය එයයි. නාට්‍යයක් නිර්මාණය කර, එය වේදිකා ගත කිරීම එහි උච්ච ප්‍රථිඵලය වුව ද ඊට මෙහායින්, නාට්‍ය වැඩමුළුවක් තුළින් විප්‍රවාසී අපේ දරු දැරියන්ට හෙළ සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳ ලැබෙන පෝෂණය හා ඇල්ම වෙනම ම මැන බැලිය යුත්තකි. වැඩමුළු තුළින් ගොඩනැගෙන්නෙ නාට්‍ය පමණක් නොවේ. උසස් රසිකත්වයක්ද ගොඩනැගේ.

අපේ රටේ මෙන් ම මෙල්බර්න් ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ද රසිකත්වය මොට කරන, බාල - අවර ගණයේ, නිර්මාණ යයි කියා හරි හැටි නමක්වත් නැති, මොනවදෝ ගෙනත් වේදිකාව මත පෙන්වන යුගයක 'ගමරාලයි සුදු අලියයි' අපූරු නාට්‍යය අත්දැකීමකි. ජනප්‍රිය නළු නිළි සහ තරු ප්‍රතිරූප පෙනී සිටින නිසා ම රොද බැඳ ගොස් ඉච්චාබංගත්වයට පත්ව නාට්‍ය රසිකත්වයෙන් ඈත් වෙන මෙරට ලාංකිකයන් බොහෝ දෙනෙකු 'ගමරාලයි සුදු අලියයි', 'රාසිං දෙයියෝ ' (The god king) වැනි මෙල්බර්න්වල අපේ නිර්මාණකරුවන්ගේ නාට්‍ය බැලීමට උත්සාහයෙන් හෝ කැඳවා ගත යුතුව ඇත. නාට්‍ය ගෙන්වන සංවිධායකවරුන්ට ද අප ආරාධනා කරන්නේ, මෙම නාට්‍යයන් බලන්නට එන්නය. තම ව්‍යාපෘති සඳහා හෝ ලාබ සඳහා හෝ මෙවැනි නාට්‍ය නැවත නැවත සංවිධානය කරන ලෙස ය.

සරල ගැමි කථාවක් තුළ නාට්‍ය අවස්ථාවන් මනාව හඳුනාගෙන එය වේදිකාවට ගෙන එන හැටි 'ගමරාලයි සුදු අලියයි' මොනවට දෙස් දෙයි. නිර්මාණකරුවාගේ පරිකල්පනය ඇත්තේ එතැන ය. එය ළමා නාට්‍යයක් විය හැක. එහෙත් එහි අපූර්වත්වය වැඩිහිටියන්ට පවා විඳිය හැකි විය යුතුය. කුසුම්සිරි සහ යසෝධරා 'ගමරාලයි සුදු අලියයි' තුළින් ඒ ශක්‍යතාවය විදහා පායි. ඉංගිරිසි ඌරුවට සිංහල කථා කරන අපේ යෞවන හා ළමා පරපුර ගැමි උච්චාරණයට හැඩ ගස්සවයි. අංග චලනයන් පුහුණු කරවයි. අපේ බෙර හඬට පුරුදු කරයි. තාල-රාග අසන්නට සහා ගායනය කරන්නට සලස්ව යි.

එපමණක් නොවේ. අප අසා ඇති 'ගමරාල දිව්‍ය ලෝකේ ගිය හැටි' සරල ගැමි කථාව වේදිකාව මත දිග හැරෙන අපූරුව ඔබ අතපසු නො කර බැලිය යුතුම ය. දිව්‍ය ලෝකේ සිට මනු ලොවට වැටෙන අලි පැටියකු ගමරාලගේ හේනේ ඇති පැණි කොමඩු, කෙහෙල්කැන්, බඩ ඉරිඟු, උක් ගස් කා දමා, කෙළිදෙලෙන් මුළු වගාව ම විනාශ කරන හැටි, ගමරාල වංගෙඩි ගස් බඳින හැටි, උගුලක් අටවා දිව්‍යමය අලි පැටියා අල්ලා ගන්නා හැටිත්, පසුව අනුකම්පාවෙන් ඌව නිදහස් කර උගේ නැට්ටේ එල්ලී අහසේ පාවී යන හැටි, ඉන්පසු නැවත මනුස්ස ලෝකයට ඇවිත් මුළු මහත් ගමක් එක්ක ආයෙත් දිව්‍ය ලෝකයට යන්නට ගොස් වැඩ වරද්දා ගන්නා හැටි, අහසින් පොළවට බිම වැටෙන හැටි...... කොහොමද මේ සිදුවීම් නාට්‍යයකින් පෙන්වන්නේ?..... ඒක තමයි අපූර්වත්වය. ලොකු පුංචි ඔබ සැම නිසැකව ම පැමිණ විඳ ගත යුතු අපූරු නාට්‍ය අත්දැකීම.

නැවතත් මෙම ලිපියේ මුලින් නැගූ පැණයට ඔබව යොමු කළ යුතුය. විස්වාස කළ නොහැකි අභව්‍යය දෑ වලින් පිරුණු සමහරක් ජන කථා මෙන් ම ජාතක කථා අපේ සංස්කෘතියේ සහ සාහිත්‍යයේ අඩංගු වන්නෙ ඇයි? ජනප්‍රිය පිළිගැනීම වන්නේ ඒවායින් සමාජයේ යහ පැවැත්මට කිසියම් උපදේශයක්, පාඩමක් කියා දීමය. කලාව ඇයි යන්නට ජනප්‍රිය පිළිගැනීම වන්නේත් ආනන්දයෙන් ප්‍රශ්ශ්දාව කරා රසිකයා ඔසවා තැබීමය. ප්‍රශ්ශ්දාවන්තයන් පිරි සමාජයක යහ පැවැත්ම අනවරත ඵලයකි. දිව්‍ය ලෝකයට යන්නට පොරකන ගැමියන් රොත්තම අහසින් බිමට වැටුනත්, ගමරාලයි සුදු අලියයි නාට්‍යය තුළින් ප්‍රෙක්ෂක ඔබව ඔසවා තැබීමට තැත් කරන්නෙ ද සෞන්දර්යාත්මකව එවැනි උස් වූ තැනක ය.





"The meaning of life is the meaning that you give to your life. Giving to a good cause is the cause for goodness to grow in the world. When you make a better world, you become a better person. That is how you discover the meaning of life." - Ajahn Brahm -

The opportunity to support the establishment of a monastery is rare. To be able to support one that provides a practice environment for both Bhikkhunis and Bhikkhus is even more unique. Such a golden opportunity arises here with the support for the BSV Forest Monastery project.

Having the support of this theatre production for the raising of funds towards the Forest Monastery in Newbury is inspirational and really shows the love and respect for the Buddha, Dhamma and the Sangha in the modern age.

\- Monk Jag

### ඇයි 'ගමරාලයි සුදු අලියයි' අගෝස්තු 24 දෙවැනි වරටත් වේදිකා ගත කරන්නේ?....

මෙම නාට්‍යය නැරඹීමෙන් වික්ටෝරියානු බෞද්ධ සංගමය, එහෙමත් නැති නම් THE BUDDHIST SOCIETY OF VICTORIA (BSV) විසින් දියත් කර ඇති වනගත ආරණ්‍යය ඉදි කිරීමේ ව්‍යාපෘතියට දායක වීමට ඔබටත් අවස්ථාව උදා වෙයි. අජාන් බ්‍රහම් තෙරුන් ගේ අනුදැනුමෙන් අරම්භ කර ඇති මෙම වනගත ආරණ්‍යය පිහිටා තිබෙන්නේ මෙල්බර්න් නුවරට විනාඩි 70 ක දුරින් පිහිටි 'නිව් බරි' (Newbury) නම් කැලෑබද ප්‍රදේශයේ යි. මෙම මහගු කාර්යයේ නියමුවන් වන්නේ අජාන් ජැග් තෙරුන් සමග ආයා උපේක්ඛා තෙරනියන් ය. භික්ෂූන්ට මෙන් ම භික්ෂුණීන්ටත්, උපාසක උපාසිකාවන්ටත් නැවතී භාවනා ආදී කටයුතු කරගෙන යාමට නිදහස්, නිවහල් බෞද්ධ පරිසරයක් ලොවට දායාද කිරීමට ඔබත් අතහිත දෙන්නේ නම් භාග්‍යයකි. මේ පිළිබඳ වැඩි විස්තර bsv.net.au වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

## TICKET BOOKINGS CONTACT

METTA 9859 7562 (AFTER 8PM) DILKY 0403 748 460
SEWWANDIKA 0430 540 318 SALIYA 0437 781 673

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com